**ශීර්ෂය - 212 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 212 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල

සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 154 (6) වාර්තාවේ 1.6.1 (ආ) (i) | ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩිනම් කල යුතුය. | 3.3 |
| 154(6) වාර්තාවේ 1.6.1(ආ)(ii) | ඉඩම් තක්සේරු කර ගිණුම්වලට ඇතුලත් කල යුතුය. | 1.6.1(අ) (i) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2020 ජූනි මාසයේ හා 2021 අප්‍රේල් මාසයේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට පවරා දෙනු ලැබූ පිළිවෙලින් ඇඹිලිපිටිය පල්ලේගම පිහිටි හෙක්ටයාර 0.0960 ක ඉඩම සහ කොත්මලේ කොට්ඨාශයට අයත් රිවර්සයිඩ් වතු බංගලාව සහ තවත් ගොඩනැගිලි ඇතුළත් හෙක්ටයාර් 0.328 ක ඉඩම තක්සේරු කර 2023 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට හෝ ඇතුලත් කර නොතිබුණි. | ඇඹිලිපිටිය පල්ලේගම ඉඩම 2024 වර්ෂයේදී වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කර ඇති අතර රිවර්සයිඩ් වතු බංගලාව සහ තවත් ගොඩනැගිලි පවරා දුන් බවට ලිපිය ලැබීමෙන් පසුව වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලබන බව. | දෙපාර්තමේන්තුවට පවරා දෙනු ලැබූ ඉඩම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| **(ii)** | නාගරික සංවර්ධන අධිකාරියට අයත් වියත්පුර නිවාස සංකීර්ණයෙන් නිල නිවාස 03 ක් රු.34,700,936 ක වටිනාකමකට විභාග දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුලදී මිලදීගෙන තිබුණද, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ අදාල වත්කමෙහි වටිනාකම රු.2,045,186 ක් ලෙස සටහන් කර තිබීම හේතුවෙන් රු.32,655,750 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කිරීම් සිදු කර ඇත. | වත්කම්වල වටිනාකම නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් නොවන ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉවත ලන කඩදාසි විකිණීමෙන් 2020 වර්ෂයේ සිට වාලච්චේන කඩදාසි කම්හලෙන් දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු රු.10,870,520 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | අයකර ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති බව. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී අවශ්‍යතාවයන් හඳුනාගෙන නිශ්චිත සැලැස්මක් යටතේ ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 15ක් සඳහා සියයට 20 සිට සියයට 10 දක්වා පරාසයක රු.4,190,427,486ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණු අතර ඉන් වැය විෂයයන් 03 ක ඉතිරිවීම් සියයට 99 හා සියයට 100ක අගයක් ගෙන තිබුණි. | අනපේක්ෂිත අයුරින් අදාල වියදම් ඇති නොවීම හා 2023 වර්ෂයේ විභාග කාල සටහන සංශෝධනය වීම මත විභාග සඳහා වැය වන ඍජු හා වක්‍ර සියළු වියදම් වල අඩු වීමක් සිදු වූ බව. | නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු සකස් කල යුතුය. |

### 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සය මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් ඉදිකිරීමේ සමාගමට ගෙවිය යුතු රු.5,367,686 ක මුදල බැරකම් ලෙස හඳුනා ගෙන නොතිබුණි. | අතපසු වීමකින් ඇතුලත් කර නොතිබුණු බව. | සියලුම බැරකම් විධිමත් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) | මුදල් රෙගුලාසි 104 | **-** | ගබඩාවෙන් පාසල් විභාග සංවිධාන ශාඛාව වෙත නිකුත් කරන ලද හඬ පටිගත කිරීමේ යන්ත්‍ර 07 ක් සහ ඇගයීම් කටයුතු සඳහා භාරදී තිබුණු හඬ පටිගත කිරීමේ යන්ත්‍ර 16 ක් අස්ථානගත වී තිබුණ ද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විමර්ශනයක් සිදු කර අවසන් වාර්තාව සකස් කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 756 | - | 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2024 අප්‍රේල් 15 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | රහස්‍ය මුද්‍රණාලයේ සමීක්ෂණ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණකාධිපති වෙත යැවීමට ප්‍රමාද වූ බව. | මුදල් රෙගුලාසි අනුව භාණ්ඩ සමීක්ෂණ නියමිත කාලය තුළ සිදුකළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 751 | - | 2022 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශාඛාවන් 08 ක භාණ්ඩ අයිතම 45 ක ඒකක 209 ක අතිරික්තයක් හා ශාඛාවන් 10 ක භාණ්ඩ අයිතම 102 ක ඒකක 622ක ඌනතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි**.** | එම ඌනතා වලින් වැඩි කොටසක් 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් වන අතර ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 වර්ෂයේදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් මතු වූ ගැටළු විමර්ශන කිරීම සඳහා පත් කරන ලද විද්වත් කමිටු යෝජනාවකට අනුව 2017 වර්ෂයේදී ආරම්භ කර 2019 පෙබරවාරි 02 දින අවසන් කිරීමට නියමිත සයමහල් බහු කාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.564,320,835 ක කොන්ත්‍රාත් මුදලකට ඉංජිනේරු සංස්ථාව වෙත භාර දී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට අවුරුදු 05 කට ආසන්න කාලයක් ප්‍රමාද වී තිබියදී ඉදිකිරීම් ප්‍රගතිය සියයට 92 ක් පමණක් වූ අතර මෙම ඉදිකිරීම වෙනුවෙන් එදිනට ඉංජිනේරුමය කාර්යයන් සඳහා මධ්‍යම උපදේශක කාර්යංශයට රු.81,729,560 ක් ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට රු.369,555,925 ක් ද වශයෙන් රු.451,285,486 ක් ගෙවීම් සිදුකර තිබුණි. | 2019 අප්‍රේල් මස සිදු වූ පාස්කු ප්‍රහාරය, පැවති අයහපත් කාලගුණ තත්ත්වය, කොවිඩ් 19 වසංගත තත්ත්වය, රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද වූ බව. | සැලසුම්ගත පරිදි නියමිත කාලයේදී ඉදි කිරීම් කටයුතු අවසන් කල යුතු වීම. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සකස් කර පරිවර්තන කටයුතු සඳහා යොමු කර ඇති බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය තුළ ඇතුලත් රු.630,000,000 ක් වටිනාකමැති දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති බත්තරමුල්ල පිහිටි හෙක්ටයාර 1.356 ක ඉඩමෙහි නිත්‍යානුකූල අයිතිය මෙතෙක් පවරාගෙන නොතිබුණි. | විගණන කළමනාකරණ රැස්වීමේ තීරණය අනුව ගාස්තු ගෙවීමකින් තොරව ඉඩම පවරාගැනීම සඳහා 2024 මාර්තු 06 දිනැති අධ්‍යාපන ලේකම් වෙත නව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද බව. | ඉඩම පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

**3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 වගන්තිය අනුව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වෙනි අධිකාරියේ 4 වගන්තියට අනුව ඇප තැබිය යුතු නිලධාරීන්,ඇප තැබිය යුතු ප්‍රමාණය හා ක්‍රමය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට කළ හැකි බව දක්වා තිබුණද දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධයෙන් මෙතෙක් එසේ කටයුතු කර නොතිබුණි. | නව කමිටුවක් පත්කර කඩිනමින් ඉදිරි කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසිවලට හා ඇප ආඥා පනතට අනුකූලව කටයුතු කළ යුතුය. |

**3.5 අනාර්ථික ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ පවත්වන ලද විභාග සඳහා ඩිජිටල් මුද්‍රණ ඒකකය සතු මුද්‍රණ යන්ත්‍ර 04 සහ රහස්‍ය මුද්‍රණාලය සතු මුද්‍රණ යන්ත්‍ර 06 ක් භාවිතා කරමින් ප්‍රශ්න පත්‍ර 78,680,276 ක් මුද්‍රණය කර තිබුණි. එම යන්ත්‍ර අතුරින් 2018 වර්ෂයේදී රු.546,264,452 ක වියදමක් දරා මිලදී ගනු ලැබූ වෙබ් ඩිජිටල් ප්‍රින්ටින් යන්ත්‍රය උපයෝගී කරගෙන 2023 වර්ෂයේදී ප්‍රශ්න පත්‍ර 13,395,680 ක් පමණක් මුද්‍රණය කර තිබුණු අතර එම ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ සමස්ථ ප්‍රශ්න පත්‍ර මුද්‍රණ ප්‍රමාණයෙන් සියයට 17 කි. යන්ත්‍රය අළුත්වැඩියා කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.5,388,311 ක මුදලක් ද වැයකර තිබුණි. | යම් යම් තාක්ෂණික ගැටළු හේතුවෙන් යන්ත්‍රයේ උපරිම ධාරිතාවයෙන් මුද්‍රණ කටයුතු සිදු කිරීමට නොහැකි වූ අතර 2023**.**08.28 දින වන විට ගැටළු විසඳා අ.පො.ස. උ.පෙළ 2023 (2024) විභාගයේ ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාවෙන් සියයට 26.59 ක් මුද්‍රණය කර ඇති බව. | අවශ්‍යතාවය හඳුනා ගෙන වත්කම් මිළදී ගතයුතු අතර මිළදී ගත් යන්ත්‍ර උපරිම ධාරිතාවයෙන් යුතුව භාවිතා කලයුතුය. |
| (ආ) | ප්‍රශ්න පත්‍රවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා 2018 වර්ෂයේදී රු.**8,428,637** ක් වටිනා වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රයේ Wrapping Solution කොටස මිලදීගෙන තිබුණ ද දැනට භාවිතා කරන රහස්‍ය ලේඛන ඇසුරුම් ක්‍රියාවලිය සමඟ එම කොටස නොගැලපීම හේතුවෙන් 2024 ජූලි දක්වාම එම යන්ත්‍ර කොටස නිශ්කාර්යව පැවතුණි. | එම කොටස රහස්‍ය පාසල් විභාග ශාඛාවේ අවශ්‍යතාවය හා නොගැලපෙන බැවින් භාවිතයට ගැනීමක් සිදු නොවිණි. වෙනත් කිසිඳු ශාඛාවකට එහි අවශ්‍යතාවයක් නොමැති බව දන්වා ඇති බැවින් ගත යුතු ක්‍රියාමාර්ග | අදාළ යන්ත්‍ර කොටස මිලදී ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේ සිට මිලදී ගැනීම දක්වා වූ ක්‍රියාවලියට සම්බන්ධ වූ සියළුම වගකිව යුතු පාර්ශවයන්ගෙන් රජයට සිදුවූ අලාභය අයකර ගැනීමට පියවර ගත |

| | | | |
|---|---|---|---|
| | | පිළිබඳව අදාල නියෝජිත ආයතනය සමඟ සාකච්ඡා කරමින් පවතින බව. | යුතුය. |
| **(ඇ)** | 2005 වර්ෂයේදී මිලදී ගනු ලැබූ Stitch Master Gathering and wire Stitching machine යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමේ දී කොළ ඉවතට හැලීම හේතුවෙන් මිලදීගත් මුල් අවස්ථාවේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම භාවිතයෙන් ඉවත් කර තිබුණි. තවද අදාල යන්ත්‍රය මිලදී ගැනීමට අදාල ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාල සැපයුම්කාර සමාගම විමසා යන්ත්‍රය අවශ්‍යතාවය අනුව සක්‍රීය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | යන්ත්‍රය භාර ගැනීමේදී එහි ක්‍රියාකාරීත්වය පරීක්ෂාකර දෙපාර්තමේන්තු අවශ්‍යතාවයට නොගැලපෙන විට යන්ත්‍රය නැවත යැවීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු සියලු පාර්ශවයන් හඳුනාගෙන රජයට සිදුවූ අලාභය අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුල පවත්වා තිබුණු ආයතන විභාග වෙනුවෙන් රාජ්‍ය ආයතන 17 කින් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.413,741,500 ක් 2024 ජූලි මාසය දක්වාම අයකර ගෙන නොතිබුණි. | අදාල ආයතන වෙත ලිපි යවා ඇති බව. | කඩිනමින් අයකර ගැනීමට ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් සකස් කල යුතුය. |
| (ආ) | රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නිරත වන නිලධාරීන් සේවයේ ස්ථිර කිරීම්, උසස් කිරීම් හා විශ්‍රාම ගැන්වීම් සඳහා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වන අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) විභාගයන්හි ප්‍රතිඵල සනාථ කර ගැනීම අවශ්‍ය වුවද 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රතිඵල සනාථ කිරීම් කල යුතු ප්‍රමාණය 8,000 ක් පමණ වී තිබුණි. | මුද්‍රණ යන්ත්‍රවල කාලය පරණ වීම නිසා නිතර නිතර අක්‍රිය වීම් වලට ලක් වේ. ප්‍රතිඵල සනාථ කිරීම් කඩිනම් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කරමින් පවතින බව. | විභාග ප්‍රතිඵල සනාථ කිරීමේ ක්‍රමවේදය විධිමත් කඩිනම් වැඩපිළිවෙලක් ස්ථාපිත කළ යුතුය. |
| (ඇ) | 2018 වර්ෂයේදී රු.28,500,000 ක් වැයකර දෙපාර්තමේන්තුව විසින් කිලෝවොට් 250 ක සූර්ය බලශක්ති පද්ධතියක් සවිකර තිබුණු අතර පද්ධතිය ස්ථාපනය කළ දින සිට වසර හතක කාලයක් අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු සැපයිය යුතු බවත්, රඳවාගත් මුදල් සියයට 10 නිදහස් කිරීමට පෙර සැපයුම්කරු විසින් නඩත්තු සේවා සැපයීම සම්බන්ධයෙන් ගිවිසුමක් අත්සන් කළ යුතු බවත්, ලංසු ලියවිලිවල දක්වා තිබුණ ද 2018 ජූලි 12 දින වන විට මෙම ව්‍යාපෘතියට අදාළ සියලුම මුදල් | නව සේවා ගිවිසුමක් ඉදිරිපත් කරන ලෙස **Ginso** ආයතනය වෙත දන්වා ඇති අතර එය ලද පසු ගිවිසුම් ගත වීමට කටයුතු කරනු ලබන බව. | සේවා සැපයුම් සඳහා ගිවිසුම් අත්සන් කළ යුතු අතර නඩත්තු ආයතන සමග සාකච්ඡා කර සේවා කටයුතු ඉතා ඉක්මණින් සිදුකර ධාරිතාවය උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවා අවසන් කර තිබුණු අතර මේ වන තෙක් සේවා සපයන ආයතනය සමඟ නඩත්තු ගිවිසුමකට එළඹී නොතිබුණි. මේ හේතුවෙන් සූර්ය බලශක්ති පද්ධතියේ නඩත්තු කටයුතු නිසි පරිදි සිදුවී නොතිබුණි. | | |
| (ඇ) | 1990 වර්ෂයට පෙර වර්ෂවල වූ විභාග ප්‍රතිඵල ලේඛන මහජනතාව වෙත අවශ්‍ය අවස්ථාවන්හී දී නිකුත් කිරීමට පහසු වන ආකාරයට එම ප්‍රතිඵල ලේඛන පරිලෝකනය (scan) කර තබාගත හැකි ආකාරයේ මෘදුකාංගයක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය 2018 වර්ෂයේ ආරම්භ කර තිබුණද එහි පැවති අඩුපාඩු හේතුවෙන් එම ගිවිසුම අවලංගු කර තිබුණි. මේ හේතුවෙන් 2000 වර්ෂයට පෙර ප්‍රතිඵල ලේඛන සංරක්ෂණය කිරීම, මුල් පිටපත පරිලෝකනය කිරීම, ප්‍රතිඵල ලේඛනයේ ඇතුළත් තොරතුරු පදනම් කරගනිමින් සහතික පත්‍ර / සනාථ ලිපි මුද්‍රිත පිටපත් ලෙස ලබා ගැනීම, විභාග අංකය හා වර්ෂය ඇතුලත් කර විභාග ප්‍රතිඵල නිවැරදිව ලබා ගැනීමට හැකිවන සේ දත්ත පද්ධතියත් සකස් කිරීම, පරිගණක තොරතුරු පද්ධතියක් තුල විභාග සහතික පත්‍රයේ අඩංගු සියලුම විස්තර ඇතුලත් කිරීම සහ එම තොරතුරු දත්ත පද්ධතියක් ලෙස පවත්වාගෙන යාම යන අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | 2018 වර්ෂයේ දී පෞද්ගලික ආයතනය වෙත ආරම්භක අදියරක් වශයෙන් භාරදෙනු ලැබූ ලේඛන 5000 ක නියැදිය අපේක්ෂිත තාක්ෂණික පිරිවිතර සාක්ෂාත් වන අයුරින් ඉටු නොකිරීම හේතුවෙන් එම සමාගමේ ඇනවුම් ලිපිය අවලංගු කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා නැවත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති බව. | පැරණි හා නව ලේඛන සංරක්ෂණයට අදාලව ක්‍රමවේදයන් ප්‍රමාදයකින් තොරව හා විධිමත්ව ස්ථාපිත කල යුතුය. |
| (ඉ) | දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය හා ඊ සේවාවන්ට අදාල සේවා ගිවිසුම 2021 නොවැම්බර් 30 වන දින අවසන් වී තිබුණ ද වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට නොහැකි වීම නිසා වෙබ් අඩවිය හා විද්‍යුත් සේවාවන් අනාරක්ෂිත වී තිබුණි. | නඩත්තු හා සේවාවන් වෙනුවෙන් නව ආයතනයක් තෝරා ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති බව. | වෙබ් අඩවිය හා විද්‍යුත් සේවාවන් ආරක්ෂිතව පවත්වා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | AS/400 පරිගණක පද්ධතිය IBM Power 9 දක්වා යාවත්කාලීන කිරීමේ ක්‍රියාපටිපාටිය සඳහා දෙපාර්තමේන්තුව විසින් රු.184,689,755 ක පිරිවැයක් 2021 දෙසැම්බර් මාසයේදී අයකරගෙන තිබුණි. සිව්වන වසරට අදාල සේවා හා නඩත්තු ගිවිසුම 2024 ජුනි 14 දිනෙන් අවසන් වන නමුත් රු.19,069,527ක් වූ ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් සේවා ගිවිසුම දීර්ඝ කිරීමට නොහැකි වී තිබුණි. එසේම මෙම පරිගණක පද්ධතියේ ආයු කාලය වසර 05ක් වුවද යාවත්කාලීන කිරීමේ ක්‍රියා පටිපාටිය සිදු කිරීමට පෙර සිදු කළ යුතු පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක්ද සිදු කර නොතිබුණි. | පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා කිසිදු පාර්ශවයකින් ඉල්ලීම් කර නොමැති බව. | රාජ්‍ය මුදල් වැය කිරීමට පෙර පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදුකල යුතු වීම. |
| (උ) | එසේම පෙර භාවිතාකල පැරණි AS400 IBM Power 6 පරිගණක පද්ධතිය අපහරණය කිරීමට අවශ්‍ය පියවර මෙතෙක් ගෙන නොතිබුණි. | අපහරණ කටයුතු සිදු කිරීමට පෙර දත්ත මකා දැමීම සඳහා අවශ්‍ය විශේෂඥ උපදෙස් ලබා ගැනීමට නොහැකි වී ඇති බව. | AS400 IBM Power 6 පරිගණක පද්ධතියේ දත්ත නිවැරදිව නව පද්ධතියට ලබාගත් බව තහවුරු කරගෙන පැරනි පද්ධතියේ දත්ත මකා දැමීම, සිදු කර කඩිනමින් අපහරණය සිදුකල යුතු වීම. |
| (ඌ) | 2023 වර්ෂයට අදාල 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සහ 2022 වර්ෂයට අදාල අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග පිළිවෙලින් 2023 ඔක්තෝබර් 15, 2023 මැයි 29 සිට 2023 ජුනි 08 දක්වා සහ 2023 ජනවාරි 23 සිට 2023 පෙබරවාරි 17 දක්වා පවත්වා තිබුණි. එම විභාගවල නැවත සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමට ප්‍රතිඵල ලබා දුන් දින සිට පිළිවෙලින් මාස 03 ක්, මාස 05 ක් සහ මාස 02 ක් ගත වී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | අපේක්ෂකයන්ට අසාධාරණයක් නොවන පරිදි නැවත සමීක්ෂණ ප්‍රතිඵල කඩිනමින් නිකුත් කල යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවා අවශ්‍යතාවය දැඩිව පවතින පරිගණක ශාඛාව මගින් වැඩසටහන් සම්පාදනය හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම අනුමත තොරතුරු තාක්ෂණ සහකාර නිලධාරීන් සංඛ්‍යාව 20 දෙනෙකු වුවද 2023 දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව 09 දෙනෙකු වූයෙන් පුරප්පාඩු 11 ක් පැවතුණි. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම විවෘත තරඟ විභාගය 2021 (2024) හි ඇගයීම් කටයුතු සිදු කරමින් පවතින බව. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් කඩිනමින් සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට අදාළ පරිගණක දත්ත ඇතුළත් කිරීම්, ඒ සඳහා අවශ්‍ය සංශෝධනයන් සිදුකිරීම්, අපේක්ෂක ලකුණු සටහන් කිරීම ඇතුළු රාජකාරි සිදු කරනු ලබන අනුමත විභාග දත්ත සහකාර කාර්ය මණ්ඩලය 49 ක් වන නමුත් තත්‍ය සේවක සංඛ්‍යාව 07 දෙනෙක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 42 ක් වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | බඳවා ගැනීම් කඩිනමින් සිදු කල යුතු වීම. |
| (ඇ) | දෙපාර්තමේන්තුව මගින් පවත්වන විභාග සඳහා අවශ්‍ය ප්‍රශ්නපත්‍ර මාර්ගෝපදේශ හා ඊට අවශ්‍ය ආකෘති, ඇතුළු දෙපාර්තමේන්තු පරිපාලන කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය කරන ලිපි ලේඛන, හදිසි අවශ්‍යතා ඉල්ලීම් මත අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා අවශ්‍ය ලිපි ලේඛන මුද්‍රණය කිරීමේ කාර්ය හා ඊට අදාළ කටයුතු සිදු කරනු ලබන මුද්‍රණාලයේ පුරප්පාඩු සංඛ්‍යාව 29 ක් වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | බඳවා ගැනීම් කඩිනම් කල යුතු වීම |